**02-04-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ පිවිතුරු විය යුතු නිසා, මෙම පැරණි සහ අපවිත්‍ර ලෝකය ගැන ඔබට අසීමිත නිරාශාවක් තිබිය යුතුයි. ඔබගේ ස්ථිතිය ඉහළ නගින විට, සියල්ලන්ටම සෙත සැලසෙයි.

**ප්‍රශ්නය:** ජීවාත්මයකගේ නරකම සතුරා මෙන්ම, හොඳම මිතුරා වන්නේද, තම ජීවාත්මයම බව, කියමනක් තිබේ. සැබෑ මිතුරුකම කුමක්ද?

**පිළිතුර:** නිරතුරුවම ඒකායන පියාගේ ශ්‍රීමත් අනුගමනය කිරීම සැබෑ මිත්‍රකමයි. සැබෑ මිත්‍රකම යනු ඒකායන පියා සිහිපත් කර, පිවිතුරු වී, පියාගෙන් සම්පූර්ණ උරුමය හිමි කරගැනීමයි. මෙම මිතුරුකම ඇති කරගන්නා ක්‍රමය ඔබට කියා දෙන්නේ පරමාත්ම පියා පමණයි. ඔබ සෑම ජීවාත්මයක්ම, තමාගේම හොඳම මිතුරා වන්නේ, සංගම යුගයෙදීය.

**ගීතය:** ඔබ රාත්‍රිය නිදමින්ද, දහවල කෑම කමින්ද ගෙවා දැමුවා.

ඕම් ශාන්ති. මෙම ගීතය ඇත්ත වශයෙන්ම අයත් වන්නේ භක්ති මාර්ගයටයි. ලොව පුරාම, ගීත ගායනා කිරීම, ග්‍රන්ථ හැදෑරීම සහ වන්දනා ගමන් යෑම, යන සියල්ල අයත් වන්නේ භක්ති මාර්ගයටයි. දැනුමේ මාර්ගය සහ භක්තියේ මාර්ගය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද කියා වැටහෙන්නේ ඔය දරුවන්ට පමණයි. වේද, ග්‍රන්ථ, උපනිශාද් ආදී සියල්ල අයත් වන්නේ භක්ති මාවතටයි. දැනුමේ ප්‍රතිලාභය චක්‍රයේ පළමු භාගය පුරාවටම පවතින අතර, භක්තිය, චක්‍රයේ ඉතිරි භාගය පුරා පවතී. භක්තියේ යෙදෙන අතර, ඔබ පහළට බැසිය යුතුයි. උපත් 84 ක් ගන්නා ගමන්, ඔබ පහළට බසින අතර, ඉන්පසුව එක උපතකදී, එය ඔබගේ ඉහළ නගින ස්ථිතියයි. මෙය දැනුමේ මාවත ලෙසින් හැඳින්වෙයි. දැනුම ගැන සිහි කර තිබෙන්නේ, ජීවන මුක්තිය, තත්පරයකදී හිමි කරගත හැකි බවයි. තඹ යුගයේ ආරම්භයේ සිට පැවතුන රාවනගේ රාජධානිය අවසන් වීමට තිබෙන අතර, ඉන්පසුව රාමාගේ රාජධානිය ආරම්භ වෙයි. නාටකයේ ඔබගේ උපත් 84 ඔබ සම්පූර්ණ කළ විට, ඔබගේ නැඟීමේ තත්ත්වය නිසා, සෑම කෙනෙකුටම යහපතක් සැලසෙයි. මෙම වදන් කොතැනක හෝ, එක් හෝ වෙනත් ග්‍රන්ථයක සඳහන් වී තිබේ. ඔබගේ ස්ථිතිය ඉහළ නගින විට, සෑම කෙනෙකුටම සෙත සැලසෙයි. සියල්ලන්ටම විමුක්තිය ලබා දෙන්නේ ඒකායන පියා පමණයි. විවිධාකාරයේ සන්යාසීන් ආදිය සිටින ආකාරයෙන්ම, විවිධ වූ මති මතාන්තර හා අදහස් තිබේ. එක් චක්‍රයක කාල වකවානුව වසර සිය දහස් ගණනක් බව, ග්‍රන්ථ වල ලියා ඇත. ශංකරාචාර්යගේ අදහස වන්නේ එය වසර 10,000 ක් පවතින බවයි. එය ඉතා විශාල වෙනසකි. තවත් සමහරු පවසන්නේ එය වසර සිය දහස් ගණනක් පවතින බවයි. කලි යුගයේ, බොහෝ මනුෂ්‍යයින්, බොහෝ අදහස් සහ බොහෝ විවිධ ආගම් තිබේ. ස්වර්ණමය යුගයේ තිබෙන්නේ එක් උපදෙසක් පමණයි. පියා මෙතැන අසුන් ගෙන ඔය දරුවන්ට ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම කියා දෙයි. ඔබට මෙය කීමට ඔහුට කෙතරම් කාලයක් ගත වන්නේද? ඔහු අඛණ්ඩව ඔබට කරුණු කියයි. ඔබට මේ සියලුම දේවල් පෙර නොකීවේ මන්ද කියා, ඔබ නොඇසිය යුතුයි. පාසැලක, දරුවන්ට අධ්‍යාපනයක් ලබා දෙන්නේ අංක පිළිවෙලටයි. කුඩා දරුවන්ට කුඩා අවයව ඇති නිසා, ඔවුන්ට උගන්වන්නේ ඉතා ස්වල්පයයි. ඔවුන් වයසින් වැඩෙත්ම, ඔවුන්ගේ අවයවද වැඩී, ඔවුන්ගේ බුද්ධියේ අගුල් විවර වෙයි, එවිට ඔවුන්ට ඔවුන්ගේ පාඩම් ධාරණය කරගැනීමට හැකි වෙයි. කුඩා දරුවන්ගේ බුද්ධියේ කිසිම දෙයක් ධාරණය වන්නේ නැත. ඔවුන් වැඩෙත්ම, නීතිඥයින් සහ විනිසුරුකරුවන් ආදීන් වෙයි. මෙහිදී සිදුවන්නෙත් එයමයි සමහරුන්ගේ බුද්ධියට මෙම දැනුම ඉතා හොඳින් ධාරණය කරගැනීමට හැකි වෙයි. පියා පවසන්නේ : මා පැමිණ ඇත්තේ ඔබව අපවිත්‍ර බවින් පිවිතුරු කිරීමටයි, එබැවින් ඔබ තුළ අපවිත්‍ර ලෝකය පිළිබඳව නිරාශාවක් තිබිය යුතුය. ජීවාත්ම පිවිතුරු වන විට, ඔවුන්ට මෙම අපවිත්‍ර ලෝකයේ සිටිය නොහැක. අපවිත්‍ර ලෝකයේ, ජීවාත්ම අපවිත්‍ර වන අතර, මනුෂ්‍යයින්ද අපවිත්‍රයි. පිවිතුරු ලෝකයේ මනුෂ්‍යයින් පිවිතුරුයි. අපවිත්‍ර මනුෂ්‍යයින්, අපවිත්‍ර ලෝකයේ වාසය කරති. මෙය රාවනගේ රාජධානියයි. රජ සහ රැජිණ කෙසේද, ඔවුන්ගේ වැසියන්ද එසේමය. මේ සියලුම දැනුම, බුද්ධියෙන් වටහා ගත යුතුයි. මෙකල, කිසිම කෙනෙකුගේ බුද්ධියේ දෙවියන් කෙරෙහි සෙනෙහසක් නොමැත. ඔය දරුවන් පියාව සිහිපත් කරන අතර, ඔබගෙන් ඇතමෙකුගේ ඇතුලාන්තයේ ඔහු කෙරෙහි සෙනෙහස තිබේ. ඔය ජීවාත්ම, පියාට ආදරෙයි. ඔහුව හඳුනාගෙන ඇති නිසා, ඔබ ඔහුට ගෞරවය කරයි. ඔබ දැන් පෞද්ගලිකවම මෙහිදී, පියා ඉදිරියේ සිටියි. ඔබ ශිව බාබාට ඇහුම් කන්

දෙයි. ඔහු මනුෂ්‍ය වෘක්ෂයේ බීජයයි, දැනුමේ සාගරයයි, සෙනෙහසේ සාගරයයි, එමෙන්ම ආනන්දයේ සාගරයයි. කතා කරන්නේ, උත්තරීතර පියා, උත්තරීතර ජීවය, ත්‍රිමූර්ති ශිවා, ගීතාවේ දැනුම ලබා දෙන්නාය. ඔබ අනිවාර්යයෙන්ම 'ත්‍රි මූර්තිය' යන වචනය භාවිත කළ යුතුයි, මන්ද, තිමූර්තිය සිහි කර ඇති නිසා. ස්ථාපනය සිදුවන්නේ බ්‍රහ්මාගේ මාර්ගයෙනි. එබැවින් දැනුම නිසැකයෙන්ම ලබා දිය යුතු වන්නේ බ්‍රහ්මා තුළිනි. 'ශිව දෙවියන් කතා කරයි' කියා ක්‍රිෂ්ණා පවසන්නේ නැත. කිසිම දෙයක් සිතකට සංඥා දීමෙන් සිදු නොවන අතර, ශිව බාබාට ඔහු (ක්‍රිෂ්ණා) තුළට ඇතුළු විමටද නොහැක. ශිව බාබා ඇතුළු වන්නේ විදෙස් ලෝකයටයි. ස්වර්ණමය යුගය, ක්‍රිෂ්ණාගේ දේශයයි, එබැවින් එකිනෙකෙහි ප්‍රශංසාව වෙනස්ය. ප්‍රධානතම දෙය මෙයයි. ස්වර්ණමය යුගයේ කිසිම කෙනෙක් ගීතාව හදාරන්නේ නැත. භක්ති මාර්ගයේදී එය උපතින් උපතට හදාරනු ලබයි. දැනුම මාවතේදී එය සිදු වන්නේ නැත. දැනුමේ දේවල්, භක්ති මාවතේ පවතින්නේ නැත. පියා, නිර්මාපකයා, ඔබට දැන් නිර්මාණයේ මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම ලබා දෙයි. කිසිම මනුෂ්‍යයෙකුට නිර්මාපකයා විය නොහැක. මනුෂ්‍යයෙකුට, 'නිර්මාණකරු මමයි' කියා කිව නොහැක. පියාම පවසන්නේ : මම මනුෂ්‍ය වෘක්ෂයේ බීජයයි; මා දැනුමේ සාගරයයි, සෙනෙහසේ සාගරයයි, එමෙන්ම සැමටම විමුක්තිය පිරිනමන්නායි. ක්‍රිෂ්ණාගේ ප්‍රශංසාව මෙයට සම්පූර්ණයෙන්ම වෙනස්ය. එබැවින් මිනිසුන් එය කියවූ වහාම, ගීතාවේ දැනුම ලබා දුන් කෙනා ක්‍රිෂ්ණා නොවන බව, සැනෙකින් ඔවුනට වැටහෙන ආකාරයෙන්, ඔවුන්ගේ ප්‍රශංසාවේ වෙනස නිවැරදිව ලියන්න. ඔවුන් මෙම එක් කාරණාව පිළිගත් විට, ඔබ ජයග්‍රහණය ලබයි. ශිවාගේ බැතිමතුන් ඔහු වෙනුවෙන් තම ගෙල සිඳදැමීමට සූදානම් වන ආකාරයෙන්ම, ක්‍රිෂ්ණා වෙනුවෙන් මිනිසුන් බොහෝ කලබලයට පත් වෙයි. ඔවුන්ට අවශ්‍ය වන්නේ ශිවා වෙතට යෑමට පමණයි. ඒ අන්දමින්ම ක්‍රිෂ්ණාගේ බැතිමතුන් සිතන්නේ ඔවුන් ක්‍රිෂ්ණා වෙතට යන බවයි. කෙසේවෙතත්, කිසිවෙකුට ක්‍රිෂ්ණා වෙතට යාමට නොහැක. ක්‍රිෂ්ණා වෙනුවෙන් ඔවුන්ගේ දිවි පිදීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. මිනිසුන් දේවතාවියන් වෙනුවෙන් තම දිවි පුදයි; කිසි කෙනෙක් දේවතාවන්ට දිවි පුදන්නේ නැත. එම දේවතාවියන් ඔබලාය. ඔබ අයත් වන්නේ ශිව බාබාටයි. එබැවින් ඔවුන් ශිව බාබා වෙනුවෙන්ද දිවි පුදයි. ග්‍රන්ථ වල හිංසාවන් පිළිබඳ දේ ලියා තිබේ. ඔබ ශිව බාබාගේ දරුවන් වන අතර, ඔබ ඔහුට පුද කරන්නේ ඔබගේ මනස, සිරුර සහ ධනයයි. මෙයට වඩා දෙයක් එහි නැත. මේ නිසයි, මිනිසුන් ශිවා සහ දේවතාවියන්ට තම දිවි පුදන්නේ. මිනිසුන් ශිව කාශියේ ඔවුන්ගේ දිවි පිදීම, දැන් රජය විසින් නවතා දමා ඇත. අසිපත දැන් එහි නොමැත. භක්ති මාර්ගයේ කෙනෙක් සිය දිවි නසා ගන්නා විට, තමන්ගේම සතුරෙක් වීමේ අන්දම එයයි. තමන්ගේම මිතුරෙක් වීමට ඇත්තේ එක ක්‍රමයකි. පියා ඔබට පවසා ඇත්තේ පිවිතුරු වී, පියාගෙන් ඔබගේ සම්පූර්ණ උරුමයම දිනා ගන්න. ඒකායන පියාගේ ශ්‍රීමත් දිගින් දිගටම අනුගමනය කරන්න. සැබෑ මිතුදම මෙයයි. භක්ති මාර්ගයේදී, මනුෂ්‍ය ජීව, ඔවුන්ගේම සතුරන්ය. පියා පැමිණ, ඔය ජීවාත්මයන්ට මෙම දැනුම ලබා දෙන විට, ඔබ ඔබගේම මිත්‍රයන් වෙයි. ඔය ජීවාත්ම පිවිතුරු වී, පියාගෙන් ඔබගේ උරුමය හිමි කර ගනී. පරමාත්ම පියා, සංගම යුගයේදී පැමිණ, සැම ජීවයක්ම, ඔවුන්ගේම මිත්‍රයෙක් බවට පත් කරවයි. ඔය සැම ජීවාත්මයක්ම තමන්ගේම මිතුරා වෙයි. ඔවුන්ට ශ්‍රීමත් ලැබෙන විට, ඔවුන් පියාගේ උපදෙස් පමණක් පිළිපදින බව ඔවුන්ට හැඟෙයි. ඔබ චක්‍රයෙන් භාගයක්ම තමන්ගේම උපදෙස් පිළිපදිමින් සිටියා. ඔබට විමුක්තිය ලැබෙන්නේ ශ්‍රීමත් අනුගමනය කිරීමෙනි. මෙහිදී ඔබගේම මත භාවිත නොකළ යුතුයි. පියා ඔබට උපදෙස් ලබා දෙනවා පමණයි. ඔබ මෙහි පැමිණ ඇත්තේ දේවතාවන් වීමටයි. මෙහි යහපත් ක්‍රියා සිදු කිරීමෙන්, අමරණීය දේශයේදී ඔබගේ මතු උපත් වලදී, ඔබට යහපත් ඵල ලැබෙයි. මෙය මරණයේ දේශයයි. කෙසේවෙතත්, මෙහි වැදගත්කම වැටහෙන්නේ, අංක පිළිවෙලට, ඔය දරුවන්ට පමණයි. ඔබගෙන් සමහරෙකුගේ බුද්ධියට, මෙම දැනුම ඉතා හොඳින් ධාරණය කරගැනීමට හැකි වෙයි. තවත් සමහරෙකුට එය ධාරණය කරගැනීමට නොහැකි වෙයි, එබැවින් ගුරුවරයා කුමක් කරන්නද? ඔබ ගුරුවරයෙකු ගෙන් අනුකම්පාව හෝ ආශිර්වාද ඉල්ලනවාද? ගුරුවරයෙක් උගන්වා, ඉන්පසුව ඔහුගේ නිවසට යයි. දරුවන් පාසැලට යන විට, ඔවුන් පළමුව දෙවියන්ට මෙසේ වන්දනා කරයි: අහෝ දෙවියනේ! මාව සමත් කරවන්න, එවිට මා ඔබට ආහාර පූජා කරන්නම්! ඔවුන්ගේ ගුරුවරයාට ඔවුන් කිසි විටෙක මෙසේ නොකියයි, 'මට ආශිර්වාද කරන්න!'. මෙකල උත්තරීතර ජීවය, අපගේ ගුරුවරයා මෙන්ම පියාද වෙයි. දරුවෙකුට සැම විටෙකම ඔහුගේ පියාගේ ආශිර්වාද තිබෙන බව වැටහෙයි. මිනිසෙක්, දරුවන් ඇති කිරීමට ආශා කරයි මට පුතෙක් සිටින විට, මගේ ධනය ඔහුට ලබා දිය හැක. ආශිර්වාදය එයයි. පුතෙකුට ඔහුගේ පියාගෙන් උරුමයක් ලැබීම, නීතියයි, කෙසේවෙතත්, දැන් සැම කෙනෙක්ම දිගින් දිගටම තමෝප්‍රධාන් වෙයි. පියා කෙසේද, දරුවන්ද එසේමයි. දවසින් දවස, සැම දෙයක්ම තමෝප්‍රධාන් වනවා. ස්වභාව ධර්මයාද තමෝප්‍රධාන් වෙමින් පවතිනවා. මෙය දුක් දේශයයි. මෙම ලෝකය තවත් වසර 40,000ක් පවතින්නේ නම්, එහි තත්ත්වය කුමක් වෙයිද? මනුෂ්‍යයින්ගේ බුද්ධිය සම්පූර්ණයෙන්ම තමෝප්‍රධාන් වී තිබේ.

දැන්, ඔබගේ බුද්ධිය, පියා සමඟ යෝගාවේ සම්බන්ධ කිරීමෙන්, ඔබට ආලෝකය ලැබෙයි. පියා පවසන්නේ : ඔබ වැඩියෙන් යෝගාවේ සිටින තරමට, ඔබ වඩාත් ආලෝකනය වෙයි. සිහිපත් කිරීමේ සිටීමෙන්, ඔය ජීවාත්ම පිවිතුරු වී ඔබගේ ආලෝකනය වැඩි වෙයි. ඔබ සිහිපත් කිරීමේ නොසිටින්නේ නම්, ඔබට ආලෝකනය නොලැබෙයි. සිහිපත් කිරීමේ සිටීමෙන්, ඔබගේ ආලෝකනය වර්ධනය වෙයි. ඔබ සිහිපත් කිරීමේ නොසිටින්නේ නම් හෝ ඔබ පාපකාරී ක්‍රියාවන් සිදුකරන්නේ නම්, ඔබගේ ආලෝකය අඳුරු වෙයි. ඔබ සතෝප්‍රධාන් වීමට උත්සාහ දරමින් සිටිනවා. මෙම කාරණා වටහා ගත යුතුයි. ඔය ජීවාත්ම අඛණ්ඩව පිවිතුරු වන්නේ, සිහිපත් කිරීම තුළින්ය. ඔබට මෙසේ ලිවිය හැක: ශ්‍රී ක්‍රිෂ්ණාට නිර්මාණයේ හෝ නිර්මාපකයාගේ දැනුම ලබා දිය නොහැක. ක්‍රිෂ්ණාගේ තත්ත්වය, ප්‍රතිලාභයයි. මෙසේද ලියන්න: ක්‍රිෂ්ණා ජීවය, දැන් ඔහුගේ අවසාන 84 වන උපතේ සිටින අතර, ඔහු නැවත වරක් මෙම දැනුම ලබා ගන්නවා. ඉන්පසුව ඔහු නැවත වරක් අංක එකට පැමිණෙයි. ස්වර්ණමය යුගයේ 900,000 සිටින බවද පියා විස්තර කර දී තිබේ. ඉන්පසුව එම සංඛ්‍යාව වැඩි වෙයි. සම්පූර්ණ උපත් 84 ගන්නා බොහෝ සේවකයන් සහ දාසයන් එහි සිටිවි. එය උපත් 84 ක ගිණුමකි. සම්පූර්ණ ලකුණු ඇතිව විභාග සමත් වන අයයි, පළමුව පැමිණෙන්නේ. ඔබ පසුව එන තරමට, ගොඩනැගිල්ල වඩාත් පැරණි වනු ඇති, යැයි කියැවේ. ගොඩනැගිල්ලක් තැනූ විටම, එය අළුත්ය. ඉන්පසුව දවසින් දවස, එහි ආයුෂ අඩු වෙයි. එහි, රන් මාලිගා තිබෙන අතර, ඒවාට පැරණි විය නොහැක. රත්තරන් සෑම විටෙකම දිලිසෙන නමුත් එය නිසැකයෙන්ම පිරිසිදු කළ යුතු වෙයි. ආභරණ සැබෑ රත්තරන් වලින් තැනූවද, එහි දීප්තිය අඩුවන බැවින්, එය ඔප දැමීමට අවශ්‍ය වෙයි. මෙම අපායේ ඔබගේ අවසන් උපත මෙය බවත්, ඔබ නව ලෝකයට යනවාය, යන සතුට ඔය දරුවන් තුළ නිරන්තරයෙන් තිබිය යුතුයි. ඔබගේ දෑසින් දකින කුමක් වුවත්, එය අයත් වන්නේ මෙම පැරණි ලෝකයට සහ පැරණි ශරීරයට බව ඔබ දන්නවා. ඔබ දැන් නව ස්වර්ණමය යුග ලෝකයේ අළුත් සිරුරක් ගැනීමටයි යන්නේ. එහි පංච මහා භූතයන්ද අළුත්ය. මේ අන්දමින් දැනුමේ සාගරය මතගාන්න. මෙය ඔබගේ ඉගෙනුමයි. ඔබගේ මෙම ඉගෙනුම අවසානය තෙක්ම දිගටම පැවතෙයි. ඉගෙනුම අවසන් වූ විට, විනාශය සිදු වෙයි. එබැවින් ඔබ ශිෂ්‍යයින් බව සලකා, ඔබට පරමාත්ම දෙවියන් උගන්වනවා, යන සතුටින් සිටිය යුතුයි. මෙම සතුට සුළු දෙයක් නොවෙයි. කෙසේවෙතත්, මායාද ඔබ ලවා වැරදි ක්‍රියා සිදු කරවයි. ඇතමෙක් වසර 5ක් හෝ 6ක් පිවිතුරුව රැඳී සිට, ඉන්පසුව මායා ඔවුන්ව බිම හෙළයි. ඔබ වරක් වැටෙන්නේ නම්, නැවතත් එම තත්ත්වයට ඔබට පත් වීමට නොහැකි වෙයි. ඔබ වැටුණු බව දැන, තමන්ටම වෛර කරගනී. ඔය දරුවන් සෑම දෙයක්ම මතක තබා ගත යුතුයි. ඔය සෑම ජීවාත්මයක්ම, තමන්ගේම ජීවිතය ගැන මෙන්ම ඔබ මෙම උපතේදී සිදුකළ පාපයන් ගැන දන්නවා. ඔබගෙන් ඇතමෙකුට මොට වූ බුද්ධි ඇති අතර, තවත් සමහරෙකුට දුර දක්නා, පුළුල් බුද්ධි තිබේ. ඔබගේ ළමා කාලයේ ඉතිහාසය ඔබට මතක් කිරීමට පුළුවන. බාබා ද ඔහුගේ ළමා කාලයේ ඉතිහාසය ගැන ඔබට කියයි. බාබා ජීවත් වුණු නිවසද ඔහුට මතක තිබෙන අතර, දැන් එම ස්ථානයේ අළුත් නිවාස ගොඩනැඟී ඇති. ඔබට වයස අවු 6 සිට ඔබගේ ජීවිත කතාව මතක් කිරීමට පුළුවනි. ඔබට එය අමතක නම්, ඔබට මොට වූ බුද්ධියක් ඇති කෙනෙක් යැයි කියයි. පියා පවසන්නේ : ඔබගේ චරිත කතාව ලියන්න. එය ඔබගේම ජීවිතය පිළිබඳ ප්‍රශ්නයකි. ඔබගේම ජීවිතයේ සිදුවී ඇති හාස්කම් ඔබට දැන ගැනීමට පුළුවනි. ගාන්ධි, නේරු ආදීන්ගේ ජීවිත ගැන බොහෝ විශාල පරිමාණයේ පොත් පත් ලියැවී ඇත. ඇත්ත වශයෙන්ම ඔබගේ ජීවිතය ඉතාම වටින්නේය. එය ආශ්චර්යමත් ජීවිතයකි! ඔබගේ වඩාත්ම ආශ්චර්යමත් දිවිය මෙයයි. ඔබට එය විස්තර කිරීමටවත් නොහැක. මෙකල සේවය කරන්නේ ඔබ පමණයි. ලක්ෂ්මී සහ නාරායන කිසිම සේවයක් කරන්නේ නැත. ඔබගේ ජීවිත ඉතාම වටින්නේය. ඔබ අන් අයගේ ජීවිතත් ඔබගේ ජීවිතය තරම් අනර්ඝ ජීවිත බවට පත් කරවයි. හොඳින් සේවය කරන අය, ප්‍රශංසා ලැබීමට සුදුසු වන්නේය. වයිශ්නව් දේවී ආදීන්ට දේවාල තිබේ. ඔබ දැන් සැබෑ වයිශ්නවයන් බවට පත් වනවා. වයිශ්නව යනු පිවිතුරු අයයි. ඔබගේ ආහාර වේල දැන් නිර්මාංශ(වයිශ්නව්), පිරිසිදු එළවළු පමණකින් යුක්තයි. ප්‍රධානතම අවගුණය සම්බන්ධයෙන්ද ඔබත් වයිශ්නව්(පාරිශුද්ධ) වේ. ඔය සියලුම බ්‍රහ්ම කුමර කුමරියන් ජගදම්බාගේ දරුවන්ය. බ්‍රහ්මා සහ සරස්වති සිටින අතර, ඔය ඉතිරි සියලුම දෙනා ඔවුනගේ දරුවන්ය. දේවතාවියන් අංකානුරූප වන අතර, ඔවුන් පිදුම් ලබන්නේද ඒ අනුවය. කෙසේවෙතත්, ඔවුන්ට මෙතරම් අත් සංඛ්‍යාවක් තිබේ ආදී වශයෙන් කීම නිෂ්ඵලයි. ඔබ බොහෝ දෙනෙක්ව ඔබට සමාන කරවන බැවිනුයි අත් බොහෝ ගණනක් පෙන්වා තිබෙන්නේ. බ්‍රහ්මාව පිලිඹිමු කර තිබෙන්නේ අත් සියයක් හෝ දහසක් ඇතිවයි. ඒ සෑම දෙයක්ම අයත් වන්නේ භක්ති මාර්ගයටයි. පියා ඔබට පවසන්නේ : දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න. කිසිම කෙනෙකුට දුකක් ඇති නොකරන්න. කෙනෙකුට වැරදි මාර්ගය පෙන්වා දී, ඔහුට සියලු දේ, විනාශ කර දමා, අහිමි නොකරන්න. එක් ප්‍රධානතම කරුණ විස්තර කරන්න: පියා සහ උරුමය සිහිපත් කරන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වූණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ප්‍රශංසා ලැබීමට සහ පිදුම් ලැබීමට සුදුසු වීමට නම්, සැබෑ වයිශ්නවයන් වන්න. පිවිතුරු ආහාර ගැනීමත් සමඟම, ඔබ පාරිශුද්ධව රැඳී සිටිය යුතුයි. මෙම බොහෝ වටිනා ජීවිතය තුළදී, බොහෝ දෙනෙකුට සේවය කර, ඔවුන්ගේ ජීවිත ශ්‍රේෂ්ඨ කරවන්න.
2. ජීවාත්මය වන ඔබගේ ආලෝකය වැඩි වන තරමට, පරම පියා සමඟ එවන් යෝගාවේ සිටින්න. ඔබගේ ආලෝකය අඳුරු වන කිසිම පාප ක්‍රියාවක් සිදු නොකරන්න. ඔබගේම මිතුරා වන්න.

**වරදානය:** ඔබගේ මුල් අවධියේ ආසනයේ ස්ථාවරව සිටීමෙන් අහිතකර තත්වයන් ජය ගන්නා මාස්ටර් නිර්මාණකරුවෙකු වීමට ඔබට හැකි වේවා.
අහිතකර තත්වයන් පදාර්ථය හරහා පැමිණෙන අතර එබැවින් එම සිදුවීම නිර්මාණයක් වන අතර ඔබ ඔබේම අවධියේ නිර්මාණකරුවෙකි. මාස්ටර් නිර්මාණකරුවෙකු හෝ මාස්ටර් සර්වබලධාරි අධිකාරියක් පරාජය කළ නොහැක; එය කළ නොහැකි ය. කෙනෙකු තම ආසනයෙන් ඉවත් වූ විට, ඔහු පරාජය කළ හැකිය. ඔබේ ආසනයෙන් ඉවත් වීම යනු බල රහිත වීමයි. ඔබ ඔබේ ආසනයේ රැඳී සිටීමේ පදනම මත, ඔබට ස්වයංක්‍රීයව බලය ලැබේ. තම ආසනයෙන් ඉවත් වන අය පසුව මායාගේ දූවිල්ලට යති. ජීවමරණයක් ලබා ඇති බාප්දාදාගේ ආදරණීය බ්‍රාහ්මණ දරුවන්ට කිසි විටෙකත් ශරීර විඥානයේ මඩ හා සෙල්ලම් කළ නොහැක.

**පාඨය:** අධිෂ්ඨානය, ශක්තිමත් සංස්කාර පවා ඉටි මෙන් දිය කර දමයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඒකාබද්ධ ස්වරූපයේ අවධානයෙන් නිරන්තරයෙන් ජය ලබන්න.**

ඔබ මෙම දැනුමේ පුතිමූර්තියක් වන සේම, සෙනෙහසේ ප්‍රතිමූර්තියක්ද වන්න. මෙම දැනුමට සහ සෙනෙහසට ඒකාබද්ධ වීමට ඉඩ දෙන්න, මන්ද, මෙම දැනුම බීජය වන අතර ජලය වන්නේ සෙනෙහසයි. බීජයට ජලය නොලැබෙන්නේ නම්, එයට එල දැරිය නොහැක. මෙම දැනුම සමගම හදවතේ සෙනෙහස ඇත්නම්, ඔබට ලැබීම් වල ඵලය හිමි වෙයි.